# රතින් සළකුණු කෙරෙන ක්‍රියාවලියක්



බත් උපදවන ජාතියකැයි විරුදාවලි ලබන්නට සුදුසු වන ආකාරයෙන් ඈත ඉතිහාසයේ සිටම ශ්‍රී ලාංකිකයාගේ ජීවන ක්‍රමය කෘෂිකර්මය සමඟ ඇඳී-සැබැඳී තිබුණේය. කෘෂි කාර්මික කටයුතු ආරම්භ කෙරෙන වප් මඟුලේ සිට අස්වැන්න කපා පාගා දෙවියන්ට පිදෙන අළුත් සහල් මංගල්‍යය දක්වා සියළු කටයුතු රාජකීය අනුග්‍රහයෙන්ම සිදු කෙරුණේය. ජාතියේ බහුතරය තමන් ගොවියන් බව මහත් අභිමානයෙන් පැවසූහ. සංස්කෘතික අංශයේ සියළු උත්සව, සිරිත් විරිත් හා චර්යා ධර්ම කෘෂිකාර්මික අවශ්‍යතා වලට සරිලන සේ හැඩ ගැසිනි. දේශීය නැටුම් සම්ප්‍රදාය කෘෂි කාර්මික ජය ග්‍රහණයන් පිළිබිඹු කිරීම සඳහා ආරම්භ වී යැයිද මතයක් වෙයි. රාජ්‍ය පාලකයා වුවද කෙතට බැස ගොවිතැනේ නියැලෙන ගොවියෙකු විය යුතු යැයි අදහසක් පැවැති බවට සාක්ෂි නැත්තේ නොවේ. ශාඛයක දළුලන සමයෙහි පය ගැටීමෙන් එම දළු වැඩීම පමාවීම වැළැක්වීම සඳහා ශික්ෂා පද පැනවූ සමය යන්ගෙන් මෙබඳු සමාජ-සංස්කෘතික වාතාවරණයකට ලැබුන පිටුවහල අසීමිත වූයේය.

මෙලෙස කෘෂි කාර්මික පසුතලයකින් හැඩගැසුනු ශ්‍රී ලාංකික ජනතාවගේ බහු විධ සාමූහික ජීවන හා ආර්ථික රටාවට විදේශ ආධිපත්‍යයෙන් පහර වැදුනේය. එතෙක් ප්‍රමුඛස්ථානය ගත් ගොවි ජනතාවගේ අගය අඩු වන්නට විය. දුටු වන් විශ්මයට පත් කළ, ශ්‍රී ලාංකික වාරි කර්මාන් තය අභාවයට ගියේය. එතෙක් රාජ්‍ය බහු මානයෙන් පිදුන ගොවි ජනතාවගේ තත්ත්වය, ගිහි බැවින් මිදී පැවිදි බිමට පාතබන්නට තරුණයෙකුට අවවාද කරන නියාවෙන් පූජාවලිය කල මයුරපාදයන් පැවසූ............... සී සෑම් නම් සුළං බදන්නා සේ ඉතා උගහට දෙයෙකි............ සී සානා ගොවියක්හු විසින් පළමුව පලාගොස් කුඹුරෙහි වන අත් ගසා ඇළ මං පායාගෙන දෙවෙ නිව ශුභ වූ නැකතින් ගේ වඩා බිම නගා දෙසීතැන් සී සාමින් නියර කපා කැට තලා පෝරා ගා බිජුවට වඩා විධි වූ පරිද්දෙන් කුඹුර වපුටගෙන මැනව. ඒ වපුලා වූ කුඹුරෙහි සතා-සතුන් සතී යක් රැක්ක මැනව. වැට බැඳ ඉස්නන් තබා, ඒ ගොයම් නිලන අවස්ථාවෙහි කුඹුර මැද රුකවල් පැලක් තබා ගෙන, මැසි දඬෙක් ලාගෙන ගෙයිකන පතෙක රස නො දැන ඇඳෙක පිටක් නොතබා රාත්‍රි දිවා භාගයෙහි ඒ මැසි දඬේ වැදහෙව, රාත්‍රි දිවාභාගයෙහි එක් දවෙසකත් නින්දෙන් නිදා නොපියා, ගෙරින්, මීවුන්, ඌරන්, මුවන් ආදී වූ සතා - සතුන් රැක්ක මැනව. කරල් නැඟූ තෙන පටන්ගෙන පියන්වා ආදී වූ නොයෙක් රෝගයට කෙම්පත් කමසේ නැතිව කල මැනව. දවසින් දවසට කුඹුර සිසාරා අතු තබාලුව මැනව. පත් ඇද්ද මැනව. මෙසේ දුක්ගෙන ගොයම් රකීනා කල........." යන අදහසින් පැවසෙන තත්වයට අව ප්‍රමාණ වූයේ ය.

මෙලෙස විදේශීය අධිරාජ්‍යවාදීන්ගේ සංස්කෘතික හා ආර්ථික බන්ධන වලින් වෙලී අනාථ වී ගිය ජනතාව සනාථ කිරීම සඳහා "සිංහලයෙනි පිබිදෙව්" යැයි කේශර සිංහ ලීලාවෙන් හඬ නංවා, කෙත පොහොර කරන, නෙක් බිම් වලට උර දෙන ගවයා මරාකෑම තිරශ්චීන ක්‍රියාවකැයි පවසමින්, දේශීය රෙදි පිළි, එළවළු සහිත බත ආදියෙහිද ආර්ය චර්යා ධර්ම වලද අගය වටහා දීම මගින් ලක් මාතාවගේ ශ්‍රෙෂ්ඨතම පුත්‍රරත්නයක් වූ අනගාරික ධර්මපාල තුමන්ට ජනතාව තුළ සංස්කෘතික හා ආර්ථික ප්‍රබෝධයක් ඇති කිරීමට හැකියාව ලැබිණි. එම ප්‍රබෝධය මගින් ඇර ඹුන පුනරුදය තුළින් ආරම්භ වී රටේ හා ජාතියේ දියුණුව පරම අභිලාෂය කොටගත් ශ්‍රේෂ්ඨ ශ්‍රී ලාංකිකයන්ගේ අනුග්‍රහයෙන් මෑත ඉතිහාසයේදී ගොවිතැනේ හා ගොවි ජනතාවගේ අභිවෘද්ධියට කරන ලද සේවාවල අගනා ඵලයක් ලෙස සැලකිය හැකි, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ක්‍රමය, ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමන්ගේ රජයේ කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍ය ධුර දරන, ධර්මාපල තුමන් ගේ ඥාතිව ගාමිණී ජයසූරිය මන්ත්‍රීශ්වරයා ගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වීම, ඒ ශ්‍රේෂ්ඨ ලාංකිකයන්ගේ ජන සේවා වෙහි තවත් රන් අකුරෙන් ලියැවෙන ක්‍රියාවක් බව නිතැතින්ම සනිටුහන් වන්නේය.